# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 61 දරන
# ශ්‍රී සුබෝධාරාම ශාසන සේවා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය. PL 006078—11810—8

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1992 අංක 61 දරන ශ්‍රී සුබෝධාරාම ශාසන සේවා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත.

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

**එල්. ඩී.—ඕ. 25/91**

**ශ්‍රී සුබෝධාරාම ශාසන සේවා සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

“ශ්‍රී සුබෝධාරාම ශාසන සේවා සමිතිය” යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද : පූර්විකාව

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් හා ඒ සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින්ද, එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 61 දරන ශ්‍රී සුබෝධාරාම ශාසන සේවා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින්මතු “සංගමය” යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී සුබෝධාරාම ශාසන සේවා සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන්පසු (මෙහි මින්මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “ශ්‍රී සුබෝධාරාම ශාසන සේවා සමිතිය” යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධවද එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි අතර, එකී නාමයෙන් පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේද පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. ශ්‍රී සුබෝධාරාම ශාසන සේවා සමිතිය සංස්ථාගත කිරීම.

3. මෙකී සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) පේරාදෙණිය රීරිගම ශ්‍රී සුබෝධාරාම විහාරස්ථානය පවත්වා ගෙන යාම හා දියුණු කිරීම සඳහා ආධාර කිරීම ;

(ආ) භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම් සහ එය පාලනය කිරීම, පවත්වාගෙන යාම හා සංවර්ධනය කිරීම ;

(ඇ) බුද්ධ ධර්මය අධ්‍යයනය කිරීම හා ප්‍රචාරය කිරීම නංවාලීම.

(ඈ) බෞද්ධ ජීවිත ගත කිරීමට ගිහියන් පුරුදු පුහුණු කිරීම ; සහ

(ඉ) ශ්‍රී ලංකාවේ හා පිටරට වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා පැවැත්වීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේද, ඇතිවී හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේද, ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේද, ඇප මුදල් ආයෝජනය කිරීමේද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ යෙදවීමේ, නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථයන් හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් සාක්ෂාත් කර ගැනීම සඳහා අභිවර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය කවර හෝ ක්‍රියා, කරුණු හා දේවල් ඉටු කිරීමේද, ක්‍රියාවේ යෙදවීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

5. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් නැතහොත් අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත යනු කරනු ලැබිය හැකි යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලුම දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා දරනු ලැබිය යුතු ය. තවද සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාව සතු වන්නේය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

6. (1) සංස්ථාවේ කටයුතු තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලස්වා ඇත්තේවුද ඒ රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන්නා වූ ද නිලධරයන්ගෙන් හා මෙතන්තැනැත්තන්ගෙන් සමන්විත කළමනාකරණ කාරක සභාවක් විසින්, ඒ රීතිවලට යටත්ව, පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කාරක සභාව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සංස්ථාවේ කළමනාකරණ කාරක සභාව විය යුතු ය.

**සංස්ථාවේ රීති.**

7. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහාද එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමකදී එහි පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින් අනුමත වූ, මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේය. ඒ රීති සාදනු ලැබූ විට, එවැනිම රැස්වීමකදී, ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සියලුම සාමාජිකයෙක් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය

**සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.**

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමයට අය විය යුතු සියලු ණය දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

9. සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තැබීම, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු සංස්ථාවේ සභාපති හා ලේකම් ඉදිරිපිටදී මිස නොකළ යුතු ය. තවද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.